## 15. ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

### 15.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

### 15.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 11 කට රු.12,162,034 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 58 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු.192,770 ක බැරකම් දක්වා නොතිබුණි.

### 15.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

රජයේ අරමුදල්වලින් කොමිසමේ සේවකයින් 09 දෙනෙකුට රු. 1,656,650 ක ණය ලබාදී තිබුණද, ඒ වෙනුවෙන් අත්තිකාරම් ගිණුමක් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 15.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 4 ක් පැවැත්විය යුතු වුවත්, රැස්වීම් වාර 2 ක් පමණක් පවත්වා තිබුණි.

**15.5 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XIV පරිච්ඡේදයේ 4 වගන්තිය | රජයේ නිලධාරියෙකුට ආහාර සහ නවාතැන් වෙනුවෙන් දිනකට ලබාගත හැකි උපරිම සංයුක්ත දීමනාව රු. 625 ක් වුවද, කොමිෂන් සභාවේ නිලධාරීන්ට එයට පටහැනිව ගෙවීම් සිදුකර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 371(2) (ආ) | නිකුත් කරන ලද තත් කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද, කොමිසන් සභාවේ නිලධාරීන් 13 දෙනෙකු විසින් අවස්ථා 20 කදී ලබාගත් එකතුව රු.285,260 ක් වූ අතුරු අග්‍රිම දින 08 සිට දින 44 දක්වා කාල පරාසයක් ප්‍රමාද කර නිරවුල් කර තිබුණි. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛය | විදේශගත වූ නිලධාරීන්ගේ ගුවන් යානා පත්‍ර ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමෙන් හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගමෙන් හෝ මිලදී නොගෙන සමාලෝචිත වර්ෂයේදි වෙනත් පෞද්ගලික ආයතනයකින් රු.366,000 ක් වැය කර මිලදි ගෙන තිබුණි. |

**15.6 විදේශාධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් තුනක් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සළසා තිබුණු රු.7,189,178 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.8,323,760 ක් වැයකර තිබුණි. ඒ අනුව අනුමැතියකින් තොරව රු.1,134,582 ක් වියදම් කර තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සඳහා එක්සත් ජාතීන්ගේ වැඩ සටහනින් රු. 20,774,778 ක් වැය කර තිබුණත්, එම වියදම් මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියක අරමුදල් වලින් ප්‍රාදේශීය කාර්යාල හා ජංගම කාර්යාල සඳහා පසුගිය වර්ෂයේදී රු.1,662,550 කට මිලදීගත් පරිගණක හා වෙනත් උපකරණවලින් රු.373,069 ක් වටිනා පරිගණක හා වෙනත් උපාංග 95 ක් 2015 පෙබරවාරි 17 දින වනවිටත් බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

**15.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ ව්‍යාපෘති සඳහා විවෘත කරන ලද පැරණි බැංකු ගිණුම් 04 ක පැවැති එකතුව රු.698,355 ක ශේෂය කොමිසමේ අනුමැතිය මත එහි සේවකයින්ට ණය ලබාදීමේ ගිණුමට මාරුකිරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය 2015 පෙබරවාරි 15 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත බැංකු ගිණුම් හතරද ඇතුළුව කොමිෂන් සභාවේ කාර්යාලය සතුව පැවැති අක්‍රීය බැංකු ගිණුම් 06 ක් හා ක්‍රියාකාරී එක් බැංකු ගිණුමක් පැවති අතර අක්‍රීය ගිණුම් පිළිබඳ තොරතුරු විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

**15.8 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය වෙනුවෙන් පහත සඳහන් පරිදි රු.80,016 ක අසාමාන්‍ය වියදම් කර තිබුණි.

| කාර්යාලය | භාණ්ඩ අයිතම සංඛ්‍යාව | භාණ්ඩ ඒකක ප්‍රමාණය | ගතකළ මිනිස් දින ගණන | වියදම |
|---|---|---|---|---|
| | | | | රු. |
| අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | 37 | 159 | 20 | 49,693 |
| මාතර ප්‍රාදේශීය කාර්යාලය | 43 | 134 | 10 | 13,675 |
| මහනුවර ප්‍රාදේශීය කාර්යාලය | 36 | 154 | 07 | 16,648 |
| **එකතුව** | | | | **80,016** |

ප්‍රාදේශීය කාර්යාලයකට ආසන්නයේ ඇති ප්‍රාදේශීය කාර්යාලයෙන් 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු හුවමාරු ක්‍රමයට යටතේ සිදු කලේනම්, අවම පිරිවැයකින් සමීක්ෂණ කටයුතු ඉටු කර ගැනීමට හැකියාව තිබුණි .

## 15.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) මාණ්ඩලික/විධායක | 135 | 62 | 73 |
| (ii) සහයක | 72 | 55 | 17 |
| (iii) සුළු සේවක | 66 | 53 | 13 |
| එකතුව | 273 | 170 | 103 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 103 ක් පිරවීමට කොමිෂන් සභාවේ කාර්යාලය අපොහොසත් වී තිබුණි.